අපේ ඉතිහාසයන් ක්වියර් වේ

දකුණු ආසියානු ක්වියර් සහ සංක්‍රාන්ති ඉතිහාසයන් පිළිබඳ සම්පතක්

Ministry for Ethnic Communities
Te Tari Mātāwaka

RULE FOUNDATION
rulefoundation.nz

Adhikaar Aotearoa

ප්‍රකාශන හිමිකම සහ උපුටා දැක්වීම

සම්පතෙහි ප්‍රකාශන හිමිකම අධිකාර් ආඔටෙඅරෝආ සතු වේ - ©අධිකාර් ආඔටෙඅරෝආ 2024

මුද්‍රණයට සූදානම් කිරීමේ හිමිකම ෂොමුද්‍රෝ දාස් සතු වේ - © ෂොමුද්‍රෝ දාස් 2024

සිංහල පරිවර්තනය: ආචාර්ය මාග්‍රට් කුරුප්පු

මෙම සම්පතෙහි *කිසිදු* කොටසක් නිසි පිළිගැනීමකින් තොරව ප්‍රතිනිෂ්පාදනය කිරීමට අවසර නොමැත. නිර්දේශිත උපුටා දැක්වීම වනුයේ:

Bal, V. (2024). Our Histories Are Queer: A Resource of Queer and Trans South Asian Histories. *Adhikaar Aotearoa*.

පටුන

මිත්‍රත්වය/බන්ධු, ෂොමුද්‍රෝ දාස් ගෙනි 5

අධිකාර් ආඔටෙඅරෝආ (Adhikaar Aotearoa) ගැන 7

හැඳින්වීම 10

පසුබිම: යටත්විජිතකරණයට පෙර දකුණු ආසියාවේ ක්වියර් සහ සංක්‍රාන්ති ජනයා 14

විශාල “C” වචනය: යටත්විජිතකරණය 23

අපගේ අනන්‍යතාවන් 26

කෘතඥතාවයෙන් අවසන් කිරීම 36

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 39

මිත්‍රත්වය/বন্ধু, ෂොමුද්‍රෝ දාස් ගෙනී

මම මේ ග්‍රන්ථය සැදුවේ ක්වියර් මිත්‍රත්වයේ ඇති ගැඹුර සහ සුන්දරත්වය ගැන කතා කිරීමේ අරමුණ ඇතිවය. Bhondu/বন্ধু, මිත්‍රයා. අවසානයේ ස්වයං-ආදරය, ස්වයං-පිළිගැනීමක් ඔබට පත්වන මගේ ක්වියර් මිත්‍රත්වයන් තුළ මා අත්විඳ ඇති සමීප, ඇසුර, ලෙන්ගතුකම, උණුසුම සහ කොන්දේසි විරහිත ආදරය. මට අවශ්‍ය වූයේ මා තෝරාගත් whānau/poribar සමඟ බෙංගාලි ගමේ දර්ශනයක්, ෆෙනී (Feni) හි මගේ පාරම්පරික නිවස, පැතිරී තිබීම දැකීමට යි. මා මුලින් ක්වියර් පුද්ගලයෙකු ලෙසත්, පසුව දුඹුරු පැහැති පුද්ගලයෙකු ලෙසත්, ඉන්පසුව දුඹුරු පැහැති සංක්‍රාන්ති ක්වියර් පුද්ගලයෙකු ලෙසත් මාව පිළිගැනීමේ මෙම ගමනේ දී මගේ ග්‍රහණයෙන් යාන්තම් පිටත පවතින බව මා දන්නා සංස්කෘතික පදනම නැති විය. ඉතින් අපේ අතීතය මෙය වන අතර, අපේ අනාගතය විය හැක්කේ කුමක්ද? අපේ සත්ත්ව මිතුරන් සමඟ එක්වීම, අපේ අරුම පුදුම ආත්මයන් වැළඳ ගැනීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවීකරණය වූ, පීතෘමූලික, යටත්විජිතවාදී, සහ පැවැත්මේ විෂම සම්මතගත ක්‍රම ඉවත් කිරීම.

ඔබ සමීපව බැලුවහොත් ඔබට පෙනෙනු ඇත්තේ: නර්තනයෙහි යෙදෙන කාන්තාවන් දෙස තමන්ගේ ආරක්ෂක සාන්තුවරයා ලෙස පරීක්ෂාවෙන් බලා සිටින කින්නරාවෙක්: මාළු අයිනකට නායකත්වය දෙන thakurma; ක්වියර් පුද්ගලයෙක් අලමුදීන් පිළිබඳව කියවීම; සමරිසි නැන්දලා ඔවුන්ගේ chaa සහ

ඕපාදූපයේ යෙදෙමින් සිටින බව; කාමුක නොව, රොමාන්තික සහ ලිංගික පෙම්වතුන්; දෝලාවක් ඔසවා ගෙන යන්නන් සාම්ප්‍රදාය යළි අර්ථ දැක්වීම, විවිධ ස්වරූප වල සමරිසි පුරුෂ මිත්‍රත්වය, සංගීතය, සහ සෙල්ලක්කාර බව, සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ බොහෝ ප්‍රකාශයන් යන මේවාය.

බෙංගාලි ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනනුකූල සංක්‍රාන්ති පුද්ගලයෙකු ලෙස, මට මාව නිර්වචනය කිරීමට තිබුණේ ඉංග්‍රිසි භාෂාව පමණි. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය නොවූ සර්ව නාමපද නොමැති, නමුත් තවමත් මා කවුද යන්න නිර්වචනය කිරීමට වචනයක් නොමැති මගේ භාෂාව වන බංග්ලා තුළ සොයමි. සීමාවක් නොමැති සහ මගේම සංස්කෘතික හූ දර්ශනය තුළ පමණක් නිර්වචනය කර තේරුම් ගත හැකි අතිරික්තයක් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සරාගී බවක් මට මූර්තිමත් කළ හැකි විට, නිෂේධනය සහ යථා තත්ත්වය ලෙස ද්විමය බව අවශ්‍ය කරන අර්ථ දැක්වීමක් වන “ද්විමය නොවන" ලෙස මාව මා විසින් නිර්වචනය කළ යුත්තේ මන්ද?

මම මේ කොටස රචනා කළේ, ක්වියර් මිත්‍රත්වයන් ගැන කතා කිරීමේ අරමුණ ඇතිව ය. නමුත් මා හට අවසානයේදී පැහැදිලි වූයේ සුවය පැමිණෙන්නේ කලින් පැමිණි දේවල රාමුව තුළ තමාව තේරුම් ගැනීම තුළින් බවයි. මා හට නම්, එයින් අදහස් කරන්නේ මගේ ක්වියර්භාවය හෝ සංක්‍රාන්ති භාවය මගේ දුඹුරු බවින් වෙන් කළ නොහැකි බව හඳුනා ගැනීමයි. මම කවුද යන්න සඳහා මගේ භාෂාවේ වචනයක් නොතිබුණත්, මා වැනි පුද්ගලයන් සෑමවිටම මෙහි සිටි බවයි. සංක්‍රාන්ති පුද්ගලයන් විශේෂයි. අපි අපට ලබා දී ඇති දේ ඉක්මවා යමු, අපට පෙනෙන දෙයින් එහාට බැලීමට සහ අලුත් සහ අලංකාර සහ සැබෑ යමක් නිර්මාණය කිරීමට අපට හැකිවේ.

අධිකාර් ආඕටෙඅරෝආ (Adhikaar Aotearoa) ගැන

මෙම පුණ්‍යායතනය සඳහා අදහස පැමිණියේ නවසීලන්තයේ ඉන්දියානු පවුලක ඉපදී හැදී වැඩුණු සංජීව්ගේ සහ රහස් සමරිසි පුරුෂ මිනිසෙකු ගේ කතාවෙනි. තමාට කිසිදිනක තම පවුල් වෙත පැමිණිය නොහැකි බව ඔහු දැන සිටියේය. මන්දයත්, ඔහු එසේ කළහොත් ඔහු ආදරය කරන අය විසින් තමාව ප්‍රතික්ෂේප කර මඟ හරිනු ඇති බැවිනි. එබැවින් තරුණ වියේ සිටම ඔහු තුළ කාවද්දා තිබුණු බියක් සමඟ ඔහු යම් ආකාරයකට බොරුවට පෙනී සිටියේය. ඔහු කාන්තාවන් ඇසුරු කිරීම ආරම්භ කර, ඔහුගේ සමීපතම මිතුරන් ඇසුරු කිරීම නවත්වා, දිගු කලක් කෙළින් "රඟපෑම" කළ හොත් ඔහු මෙතෙක් දැන සිටි එකම පුද්ගලයින් තමාව මඟ නොහරිනු ඇතැයි තමාටම ඒත්තු ගැන්වීය. සංජීව් යනු නවසීලන්තයේ ආඔටෙඅරෝආ හි එකම අත්දැකීම් සහිත දකුණු ආසියානු LGBTQIA+ පුද්ගලයන් දහස් ගණනකින් නොවුණත් සිය ගණනින් අතරින් කෙනෙකි.

බොහෝ දකුණු ආසියාතික භාෂා වලින් අධිකාර් යන්නෙහි අර්ථය වන්නේ "අයිතිය" යන්නයි. සංජීව් හට නිදහසේ සිටීමට, අයිතිය, ආදරය කිරීමට අයිතිය, සහ තමා වීමට අයිතිය ඇත. මෙම සංවිධානය නිර්මාණය කිරීමෙන් අපේ මුතුන් මිත්තන්ට බියෙන් තොරව අසාමාන්‍ය සහ සංක්‍රාන්ති වීමට තිබූ අයිතිය යළි ස්ථාපිත කරමින් සිටිමු. අධිකාර් ආඔටෙඅරෝආ සියලුම වර්ණ සහිත පුද්ගලයන් සඳහා වන අතර, අපි විශේෂයෙන් දකුණු ආසියානු සම්භවයක් ඇති අයට සහයෝගය දැක්වීම කෙරෙහි අවධානය යොමු කරමු. මෙම සම්භවයෙන් හටගන්නා වූ දකුණු ආසියාතික රටවල් අටට ඇතුළත් වන්නේ: ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන මේවාය.

අධිකාර් ආඔටෙඅරෝආ යනු සමාජයේ මූලයන් (flax roots) සහ පද්ධතිමය වෙනස පිළිබඳව වන අතර, එය අපගේ අවධානය යොමු කරන ක්ෂේත්‍ර තුන වන අධ්‍යාපනය, උද්දේශනය සහ සහයෝගය යන මේවායින් ශක්තිමත් වී ඇත.

අධ්‍යාපනය යනු අපගේ ප්‍රජාවන්ට ප්‍රතිලාභ ලබාදෙන ආකාරයෙන් දැනුම සහ තොරතුරු නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම සහ භාවිතා කිරීමයි. අපගේ ප්‍රජාවේ බොහෝ දෙනෙකුට සහ වඩාත් පොදුවෙන් ගත් කළ සමාජයේ ඇති තොරතුරු හිඩැස් පිරවීම සඳහා මූලික වන්නේ අධ්‍යාපනයයි. අධ්‍යාපන සම්බන්ධයෙන් අප

අවධානය යොමු කරන ක්ෂේත්‍ර හතරක් ඇත: LGBTQIA+ වර්ණය සහිත පුද්ගලයන්ට තොරතුරු සැපයීම, LGBTQIA+ වර්ණය සහිත පුද්ගලයන්ගේ පවුල් සඳහා තොරතුරු සැපයීම, දකුණු ආසියානු ප්‍රජාව තුළ LGBTQIA+ වර්ණ සහිත පුද්ගලයන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම, සහ වඩාත් පුළුල් සමාජය සඳහා අධ්‍යාපනය ලබාදීම ය.

උද්දේශනය යනු දේවල් වැරදි වූ විට, හෝ දේවල් යහපත් නමුත් වඩා යහපත් විය හැකි වූ විට යම් හේතුවක් වෙනුවෙන් සහාය වීමට සහ උනන්දු කරවීමට ඔබේ හඬ භාවිතා කිරීමයි. අපට උද්දේශනය යනු අපගේ ප්‍රජාවන් සමඟ කතා කිරීම, ඔවුන්ට අවශ්‍ය දේ දැකීම සහ එය ලබාදීමයි. අපට උද්දේශනය යනු අපගේ ප්‍රජාවන් සමඟ කතා කිරීම, ඔවුන්ට අවශ්‍ය දේ දැකීම සහ එය ලබාදීමයි. අපට උද්දේශනය යනු අප කරන කාර්යයට මහා පරිමාණ හා දිගුකල් පවතින බලපෑමක් ඇති බව සහතික කරන අතර, ලෝකය තුළ අප තබා ඇති බලාපොරොත්තුව සහ වෙනස පිළිබඳ පොරොන්දුව ප්‍රකාශ කිරීමයි.

සහයෝගය යනු යමෙකුට අවශ්‍ය වූ විට ඔබ එහි සිටින බවට වග බලා ගැනීමයි. එය සවන්දීම, දයාව දැක්වීම, දිරිගැන්වීම සහ සම්බන්ධ වීම සහ බෙදාහදා ගත් අසාමාන්‍ය දේශපාලනය පිළිබඳ ගාම්භීර හැඟීමකින් සංවිධානය කිරීමයි. එය කිසිවෙකු හට තමා තනිව සිටින බව හෝ අත්හැර දමා ඇති බවට හැඟීමක් ඇති නොවීම සහතික කිරීම වේ. එය යමෙකු සමඟ ඔවුන්ගේ ස්වයං අවබෝධය පිළිබඳ ගමනේදී ඔවුන් සමඟ ගමන් කිරීම පිළිබඳව වේ.

අපි දේශීයව සහ ජාත්‍යන්තරව (විශේෂයෙන් දකුණු ආසියාවේ සහ පැසිපික් කලාපය තුළ, බොහෝ දකුණු ආසියාතික පෙළපත පදනම් වී ඇති) අපගේ ජනතාවට නොනැසී පැවතීමට පමණක් නොව, සමෘද්ධිමත් වීම සඳහා තත්ත්වයක් නිර්මාණය කිරීමට කටයුතු කරන්නෙමු. අපි කිසිදිනෙක නොනවතින්නෙමු.

හැඳින්වීම

අපට සෑදීමට අවශ්‍ය සම්පත් වර්ග ගැන සිතමින් සිටින විට, අපි අධිකාර් වාර්තාව දෙස බලා අපගේ ප්‍රජාව ඔවුන්ගේ විශාලම ගැටලු ලෙස ප්‍රකාශ කර තිබුණේ මොනවා දැයි බැලීමට තීරණය කළෙමු. අපට වැඩියෙන්ම කැපී පෙනුනේ ඔවුන් අයත් වන ජනවාර්ගික සහ ආගමික ප්‍රජාවන්ගෙන් අපගේ ක්වියර් සහ සංක්‍රාන්ති දකුණු ආසියානු ප්‍රජාවන් මුහුණ දෙන වෙනස්කොට සැලකීමයි.

මෙම වෙනස්කොට සැලකීම එක් ප්‍රධාන විශ්වාසයක් වටා කැරකෙන බව පෙනේ: එනම් දකුණු ආසියාතිකයන්ට, සමරිසි පුරුෂ, සංක්‍රාන්ති සමාජභාවී, සමරිසි කාන්තා හෝ ක්වියර් හෝ සංක්‍රාන්ති ප්‍රජාවේ කොටසක් විය නොහැකි බවයි, මන්දයත්, ක්වියර් හෝ සංක්‍රාන්ති වීම “සුදු පුද්ගල දෙයක්” වන බැවිනි. දකුණු ආසියාතික වීම සහ ක්වියර් හෝ සංක්‍රාන්ති වීම සිදුවිය නොහැකි දෙයකි.

නමුත් එය අසත්‍ය බව අපි සැවොම දනිමු.

සත්‍යය වන්නේ, ක්වියර් සහ සංක්‍රාන්ති පුද්ගලයන් අපගේ ජනවාර්ගික සහ ආගමික ප්‍රජාව තුළ සාදාකාලිකව සිට ඇත. යටත්විජිතකරණයට පෙර, ක්වියර් සහ සංක්‍රාන්ති ආසියානුවෝ පිළිගැනීමට, ආදරයට සහ ගෞරවයට පවා පාත්‍ර වූහ. නමුත් යටත්විජිතකරණයෙන් පසු ආදරයෙන් සහ ඉමහත් ලැදියාවෙන් පිරුණු ක්වියර් පරිසර වෛරයෙන් සහ සාපරාධිකරණයෙන් පිරි පරිසරයන් බවට පත්විය. යටත්විජිතකරණය හේතුවෙන් ජනවාර්ගික සහ ආගමික ප්‍රජාවන් අපට එරෙහි විය.

තවත් සත්‍යයක් නම්, ක්වියර් සහ සංක්‍රාන්ති දකුණු ආසියාතිකයින් ලෙස අප තවදුරටත් වෛරයේ සහ සාපරාධීකරණයේ මෙම තත්ත්වය පිළි නොගන්නා බවයි. අපි අපගේ පිළිගැනීම, ආදරය සහ ගෞරවය සහිත ඉතිහාසය ආපසු ලබාගන්නෙමු. නමුත් අපි මෙය සිදුකරන්නේ කෙසේද? හොඳයි, පළමු පියවර වන්නේ අපගේ ඉතිහාසය තේරුම් ගැනීමයි, අපගේ ක්වියර් සහ සංක්‍රාන්ති මුතුන් මිත්තන් කෙබඳු වී දැයි තේරුම් ගැනීමයි. මෙම සම්පතෙහි හරය වන්නේ එයයි.

ක්වියර් සහ සංක්‍රාන්ති දකුණු ආසියානුවෙනි - මෙම සම්පත ඔබ වෙනුවෙනුයි. ඔබේ ස්වදේශීය ඉතිහාසය තුළ ඔබ සහ ඔබේ අනන්‍යතාව තහවුරු කිරීම එහි අරමුණයි.

මෙම සම්පත අප අවට සිටින - අපගේ ජනවාර්ගික සහ ආගමික ප්‍රජාවන් සඳහා ද වේ. ක්වියර් සහ සංක්‍රාන්ති වීම "සුදු පුද්ගලයින්ගේ දෙයක්" නොවන බව ඔවුන්ට තේරුම් ගැනීම සඳහා ය; එය ඇත්තෙන්ම අපට ස්වදේශීය වන දෙයකි.

මෙම සම්පත තුළ අප සාකච්ඡා කරන ඉතිහාසයන් සහ අනන්‍යතාවන් සුවිශේෂී නොවේ. මෙම කාලය තුළ අපට ලබාගත හැකි සමහර සම්පත් හරහා දුර සිට මෙම ඉතිහාසයන් අවබෝධ කර ගැනීමට දරන අපගේ පළමු උත්සාහය මෙයයි. මෙම ඉතිහාසයන් ඒවායින් සීමා වී නොමැති බව අප හඳුනා ගනිමු. අපගේ ඉතිහාසයන් අසීමිත සහ බහුවිධ මූණත් වලින් යුතු වන බැවින් ඒවා ආරම්භක පියවරකි.

අපි මෙම සම්පතට අතුල්වීමට පෙර, අපට මූලික කරුණු සහ පිළිගැනීම් කිහිපයක් කිරීමට අවශ්‍ය ය. ප්‍රථමයෙන්, අපගේ දේශීය පාරිභාෂිතය හැකිතාක් භාවිතා කිරීම අපගේ අරමුණයි. කෙසේවෙතත්, අප සංසන්දනය, පහසුව සහ සාමූහික කරුණු සඳහා අපි ක්වියර් සහ ට්‍රාන්ස් බටහිර යෙදුම් භාවිතා කරන්නෙමු. අපි ඒවා මධ්‍යගත කරන බව මෙයින් අදහස් නොකරන බව සිතට ගත යුතුයි.

අපි Aotearoa, iwi Māori හි tangata whenua පිළිගනිමු. විශේෂයෙන්ම, Adhikaar Aotearoa පදනම් වී ඇති ඉඩමෙහි අයිතිකරු වන Waikate Tainui සහ අපි බෙහෙවින් අගය කරන ඔහුගේ ප්‍රතිරෝධය සහ ධෛර්යයේ ඉතිහාසය අපි පිළිගනිමු. අප මෙහි සිටින්නේ ඔබේ උදාරත්වය නිසා පමණක් බව අප අමතක නොකරමු. අපි සැමදා Te Tiriti o Waitangi සාක්ෂාත් කර ගැනීමේ අභිප්‍රාය වෙනුවෙන් මිත්‍රපාක්ෂිකයෝ වෙමු.

මෙම සම්පත සමාලෝචනය, සංස්කරණය සහ සියුම් කිරීම් වෙනුවෙන් කිරාන් පටෙල් සහ කයාත්‍රි දිවකලාලගේ දායකත්වය අපි පිළිගනිමු. ඔවුන් දෙදෙනාම වචන විමර්ශකයින් වන අතර, ඔවුන්ගේ තියුණු ඇස් වලට සහ බුද්ධියට අපි කෘතඥ වෙමු. අධිකාර් Aotearoa හි එවැනි පෙළඹවීම් සහිත, දක්ෂ සහ වෙනස වෙත නැඹුරු පුද්ගලයින් සම්බන්ධ වී සිටීම අපේ වාසනාවකි.

ඔවුන්ගේ ඉස්තරම් කලාකෘති භාවිතා කිරීම ලබාදීම වෙනුවෙන් ෂොමුද්‍රෝ දාස් හට අපි කෘතඥතාව පළ කරමු. අපට, ෂොමුද්‍රෝගේ කෘතිය දකුණු ආසියානු

ක්වියර් සහ සංක්‍රාන්ති අත්දැකීම් වල ඓතිහාසික අංග අලංකාර ලෙස නිරූපණය කරයි. අපි එය මුලින්ම දුටු විට අපි සම්පූර්ණයෙන් පුදුමයට පත්වූ අතර, එය මෙම සම්පතේ තේමාව සමඟ හොඳින් ගැලපෙන බව අපි ක්ෂණිකවම දැන ගත්තෙමු. ෂොමූද්‍රෝ, අපේ හදවතේ ගැඹුරුම තැනින් අපි ඔබට ස්තුතිවන්ත වෙමු.

අපගේ ත්‍යාගශීලී අරමුදල් සපයන්නන්, ජනවාර්ගික ප්‍රජාවන් පිළිබඳ අමාත්‍යංශය සහ රූල් පදනමෙහි දායකත්වය අපි පිළිගනිමු. මෙම සම්පත සඳහා අපට මුදල් ලබා දුන්නේ ජනවාර්ගික ප්‍රජා සංවර්ධන අරමුදල හරහා ය. අපි මෙම සහයෝගය කෘතඥව පිළිගන්නා අතර එය අවංකවම අගය කරමු.

රූල් පදනම යනු තමා ආදරය කළ රැකියාවෙන් බලහත්කාරයෙන් ඉවත් කර අවසානයේදී සමලිංගික පුද්ගලයෙකු වීම නිසා සමාජය විසින් ඔහු වෙත ප්‍රක්ෂේපණය කළ ලැජ්ජාව හේතුවෙන් සිය දිවි හානි කරගත් රාජකීය නවසීලන්ත ගුවන් හමුදා නියමයෙකු වූ පීටර් රූල්ගේ වතුයාය පරිපාලනය කිරීම සඳහා පිහිටුවන ලද සංවිධානයකි. පීටර් රූල්ගේ කතාවට වෙනස් අවසානයක් තිබිය යුතුව තිබුණි. එනම් ඔහු ආදරය, ඉමහත් ලැදියාව සහ අරමුණ සොයාගත් අවසානයකි, ඔහුට තමා වීමට හැකි වූ අවසානයකි. අපේ වැඩ කටයුතු වලදී පීටර්ගේ මතකය නොමැකෙන එකකි. අපි කරන දේ අපි කරන්නේ ඔහුගේ වැනි කතා සඳහා ය. විශේෂයෙන්ම ජනවාර්ගික LGBT+ ප්‍රජාවන්ගෙන් පැමිණෙන අය සඳහා, ඔවුන් ගත කළ යුතු ජීවිත ඒ අයුරින් ගත කිරීමට ය.

මෙම සංවිධාන දෙකේ ප්‍රදානයන් නොමැතිව මේ කිසිවක් කළ නොහැකි වනු ඇත. අපි ඔබට අවංකවම ස්තුතිවන්ත වෙමු.

පසුබිම: යටත්විජිතකරණ යට පෙර දකුණු ආසියාවේ ක්වියර් සහ සංක්‍රාන්ති ජනයා

මෙම පරිච්ඡේදය තුළ, අපි සැරසෙන්නේ යටත් විජිතකරණයට පෙර දකුණු ආසියාවේ ක්වියර් සහ සංක්‍රාන්ති පුද්ගලයන් ගේ ජීවිතය කෙබඳු දැයි සොයා බැලීමට ය. මෙය අප කරන්නේ හේතු කිහිපයක් වෙනුවෙන් ය. ප්‍රථමයෙන්, අපගේ ඉතිහාසය ගවේෂණය කිරීමෙන් සමලිංගික භීතිකාව, සංක්‍රාන්ති භීතිකාව, සහ ක්වියර් භීතිකාව යටත්විජිත ආනයනයන් බවට අපට අවබෝධයක් ලබාදෙයි: ඒවා අපගේ ඉතිහාසයේ කොටසක් නොවේ.

දෙවනුව, එය අපට ඉලක්කයක් ලබා දෙයි. අපි පහත සාකච්ඡා කරන පරිදි, ඒ කාලයේදී ක්වියර් සහ සංක්‍රාන්ති පුද්ගලයන් සඳහා සෑම දේම දේදුනු සහ හිරුඑළිය නොවීය. නමුත් අපගේ ප්‍රජාව තුළ අප මුහුණ දුන් පිළිගැනීමේ මට්ටම අප දැන් මුහුණ දෙන මට්ටමට වඩා බෙහෙවින් වැඩි විය. ඉලක්කය වනුයේ අපගේ ප්‍රජාවන්ට එම පිළිගැනීමේ ඉතිහාසයන් නැවත ලබා ගැනීම සහ, ක්වියර් සහ සංක්‍රාන්ති පුද්ගලයන් ලෙස අපගේ අතීතය යළි ලබා ගැනීමයි.

තෙවනුව, අප දැනටමත් සාකච්ඡා කර ඇති පරිදි, අප මෙන්ම ලෝකය ද අපේ ඉතිහාසයන් දැන ගැනීම ඉතා වැදගත් වේ. මන්දයත්, අපේ ඉතිහාස වලින් පෙන්නුම් කරන්නේ ක්වියර් සහ සංක්‍රාන්ති අනන්‍යතාවන් "සුදු මිනිසුන්ගේ දෙයක්"නොවන බවයි. ක්වියර් සහ සංක්‍රාන්ති දකුණු ආසියාතිකයින් ආරම්භයේ සිටම ජීවත්ව සිට ඇත.

යුරෝපීයයන් විසින් දකුණු ආසියාව යටත් විජිතකරණයට පෙර, දකුණු ආසියානු සංස්කෘතීන් විසින් විවිධ ලිංගිකත්වයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයන් පිළිගෙන ඒවාට ඉඩ දී තිබුණි. ඇත්ත වශයෙන්ම, යටත් විජිත පාලනයට පෙර, මෝගල් අධිරාජ්‍යය සමයේ පැවති මර්දනකාරී කාලපරිච්ඡේද අතහැර, එවැනි විවිධත්වයට එරෙහිව ක්‍රියාකාරී වෙනස්කොට සැලකීම පිළිබඳ සාක්ෂි පවා පෙනෙන්නට නොමැත. දකුණු ආසියාවේ යටත් විජිතකරණයට පෙර ක්වියර් වීම හෝ සංක්‍රාන්ති වීම හොඳ ලෙස දකින ලද බවත්, අපි පසුව සාකච්ඡා කරන පරිදි ගෞරවයට පවා පාත්‍ර වූ බවත් තේරුම් ගැනීමට මෙය අපට මඟපෙන්වයි.

මෙම පිළිගැනීම අපගේ ඉතිහාසයේ බොහෝ තැන්වල දැකගත හැකිය. අපි පහත ඉන් සමහරක් ගැන කතා කරමු. එසේ කිරීමට පෙර, අපගේ අනන්‍යතා පිළිබඳව ඓතිහාසික පිළිගැනීමක් තිබුණ ද, නූතන කාලයේදී එවැනි අනන්‍යතා වලට එරෙහිව වෙනස්කොට සැලකීමක් නොපවතින බව එයින් අදහස් නොවන බව

අපට අවධාරණය කිරීමට අවශ්‍ය ය. අපගේ ප්‍රජාවන් උග්‍ර වෙනස්කොට සැලකීම් සහ ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන අතර, මෙම පිළිගැනීම පිළිබඳ කතාන්දර ප්‍රජාව මුහුණ දෙන හානිය අවම කිරීමට කිසිදු ආකාරයකින් අදහස් කරන්නේ නැත.

මෙම පිළිගැනීම අපේ උපමහාද්වීපයේ විහාරස්ථාන මත කැටයම් කර ඇත...

ක්වියර් සහ සංක්‍රාන්ති මිනිසුන්ගේ කැටයම් සහිත විහාරස්ථාන හෝ ගල්ලෙන් සොයා ගැනීමට ඔබට දකුණු ආසියානු උපමහාද්වීපය හරහා එතරම් දුරක් යාමට අවශ්‍ය නොවේ. මෙම විහාරස්ථාන වලින් සමහරක් ක්‍රි.ව. 885 තරම් ඈත අතීතයකට දිව යයි. එයින් අදහස් වන්නේ අපේ ක්වියර් සහ සංක්‍රාන්ති දකුණු ආසියානු පැවැත්ම වසර 1000 කට වඩා පැරණි බවයි. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියාව පුරා ස්ථාන වලින් හමුවන මෙම කැටයම් මඟින් සමලිංගික කාමුක ක්‍රියා කිහිපයක යෙදෙන ක්වියර් සහ සංක්‍රාන්ති පුද්ගලයන් නිරූපණය කරයි. මේවාට කාන්තාවන් එකිනෙකා වැළඳ ගැනීම, පිරිමි එකිනෙකාගෙන් වින්දනය ලැබීම සහ කණ්ඩායම් කම්සුවයෙහි ගැලීම් ඇතුළත් වේ - අපේ මුතුන් මිත්තෝ නොහික්මුණු පිරිසක් වූහ, එසේ නොවේද?

... අපේ මුතුන්මිත්තන්ගේ කාව්‍යයන් තුළ සඳහන් වේ

අපේ මුතුන්මිත්තෝ ඔවුන්ගේ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විවිධත්වය ගැන කවි ද ලියූහ. මෙම කවි ලිඛිත පාඨ සමඟ අපගේ වාචික ඉතිහාස හරහා සංරක්ෂණය කර ඇත. වඩාත් ජනප්‍රිය ක්වියර් කාව්‍ය වර්ගයක් වූයේ Rekhti ලෙස

හැඳින්වෙන උර්දු ආකෘතියකි. එය බොහෝවිට ස්වරයෙන් ස්ත්‍රීවාදී වූ අතර මුළුමනින්ම ලිංගිකව නිශ්චිත ය. මෙම සමහර කාව්‍ය වල **dogana** යන වචනය කාන්තාවක් විසින් තම සමරිසි පෙම්වතාට ආමන්ත්‍රණය කිරීමේ යෙදුමක් ලෙස භාවිතා කරන අතර, ඇතිල්ලීම/වෙළී සිටීම ලෙස පරිවර්තනය කළ හැකි **chapti** නම් වචනය ස්ත්‍රී සමලිංගිකත්වය හැඳින්වීමට යෙදුමක් ලෙස භාවිතා කරයි. මෙම කවි අනුප්‍රාප්තික පරම්පරා වල ගෞරවයට පාත්‍ර වී ඇත.

... අපගේ ආගමික හා සංස්කෘතික මිථ්‍ය කථා සමූහයන් හි සඳහන් වේ

දකුණු ආසියාව එදත් අදත් ආගමේ සහ සංස්කෘතියේ සම්මිශ්‍රණයකි. අපගේ සියලුම ආගම් හා සංස්කෘතීන්, යම් අවස්ථාවක අපගේ පැවැත්ම හඳුනා ගෙන ඇත.

සංස්කෘත වීර කාව්‍යයක් වන රාමායනයේ, රාමා රජු පිටුවහල් වීමට පිටත් වන විට, අයෝධ්‍යාවේ වැසියන් සමුගැනීමට ඔහු පසුපස ගිය බව සඳහන් වේ. රාමා රජු පිරිමින්ට සහ කාන්තාවන්ට පෙරළා අයෝධ්‍යාවට යන ලෙස ඉල්ලා සිටී. කෙසේවෙතත්, ඔහු වසර 14 ක් පිටුවහල් කර සිටීමෙන් පසු යළි අයෝධ්‍යාවට පැමිණි පසු, ඔහු ගංඉවුර තරණය කළ විට එහි මිනිසුන් සිටින බව සොයා ගනී. ඔහු ව්‍යාකූලත්වයට පත්ව, ඔවුන්ට යළි අයෝධ්‍යාවට යන ලෙස ඉල්ලා සිටි විට, ඔවුන් එසේ නොගොස් එහි රැඳී සිටියේ මන්දැයි විමසුවේය. පිරිමින් සහ කාන්තාවන් නැවත අයෝධ්‍යාවට ආපසු ගිය නමුත්, ඔවුන් ඒ දෙවර්ගයටම අයත් නොවන (ඔවුහු හිජ්රා/අන්තර්ලිංගිකයන් වූහ) නිසා ඔවුහු එහි නැවතී සිටි බව පැවසූහ. රාමා රජු ඔවුන්ගේ කැපවීම ගැන පැහැදී ඔවුන්ට ආශිර්වාද කළේය. රාමාගේ ආශිර්වාදය අලුත උපන් බිළිඳුන්ට හෝ උත්සව වලදී ආශිර්වාද කිරීමට හිජ්රාට හැකි බව සැලකීමට එක් හේතුවක් වේ. අපි ‘හිජ්රා’ යන යෙදුම තෙවන පරිච්ඡේදයේ වැඩියෙන් විස්තර කරන්නෙමු.

Kathasaritsagara නම් වූ තවත් සංස්කෘත කථාවක, වෙනත් කාන්තාවක් දුටු වහාම ඇයට ඇලුම් කළ තරුණියක් ඔවුන්ගේ සම්බන්ධතාව "ස්වයම්වර සකී" (Swayamvara Sakhi) ලෙස හැඳින්වූ අතර, එයින් අදහස් වූයේ තමාම තෝරාගත් මිතුරියක් බවය. බටහිර භාෂාවෙන් මෙය ස්ත්‍රී සමරිසි සම්බන්ධතාවක් ලෙස සැලකිය හැකිය.

හින්දු මිථ්‍යා කථා වල, ක්වියර් - සහ සංක්‍රාන්ති - බව පිළිබඳව කතාන්දර කිහිපයක්ම ඇත. *අයියප්පා (Ayyappa)* පිළිබඳ දකුණු ඉන්දියානු මිථ්‍යාවේ, ශිව දෙවියන් සහ විෂ්ණු දෙවියන් අතර සමලිංගික සම්බන්ධතාවයෙන් පිරිමි දෙවියෙකු උපත ලද බව කියනු ලැබේ. ඒ හා සමානව, පුංජායාංගී (androgynous) සහ අන්තර්ලිංගික ලක්ෂණ ඇති හින්දු දෙවිවරු සිටින අතර, වඩාත් ප්‍රසිද්ධ වන්නේ අර්ධනාරීශ්වර ය (අඩක් පුරුෂ ලක්ෂණ සහ අඩක් ස්ත්‍රී ලක්ෂණ ඇති ලෙස පරිවර්තනය වේ).

ඉස්ලාමයේ, ඓතිහාසිකව පිරිමි, ගැහැණු, අන්තර්ලිංගික (khunsa) සහ පුරුෂ ගතියෙන් හීන (mukhannath) ඇතුලුව, ස්ත්‍රී පුරුෂ සමාජභාවයන් සහ ලිංගිකත්වයන් හතරක් පහක් හඳුනාගෙන ඇත. එබැවින්, සමකාලීන ඉස්ලාම් ද්විමය පිරිමි සහ ගැහැණුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගික භූමිකාවන් කේන්ද්‍රගත කරන අතර, ඓතිහාසික ඉස්ලාමය නිසැකවම ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සහ ලිංගිකත්වයෙහි බහුත්වයක් පිළිගත්තේය.

... අපේ පොත් වල පවසා ඇත

අපේ ලිඛිත පාඨයන් ක්වියර්- සහ සංක්‍රාන්ති- බව පිළිබඳ කතාන්දර සාකච්ඡා කරයි. අප ඉහත සාකච්ඡා කළ සංස්කෘත වීරකාව්‍ය සමහරක් ද ඇතුලුව මේ පිළිබඳ බොහෝ උදාහරණ ඇත. කෙසේවෙතත්, විශේෂයෙන් ප්‍රසිද්ධ එකක් ඇති බව අපි දනිමු: *කාම සූත්‍රය. කාම සූත්‍රය* ලියා ඇත්තේ ක්‍රි.පූ. 400 සහ ක්‍රි.ව. 200 අතර වේ. එයින් යෝජනා කෙරෙන්නේ එහි සාකච්ඡා කෙරෙන අනන්‍යතා සහ ක්‍රියාවන් වසර 2000 ක් පමණ පැවති බවයි. මෙය අපගේ අනන්‍යතා පැරණි බව අපට

පවසන්නේ නැත්නම්, එය කුමක් මඟින් පවසයි දැයි අපි නොදනිමු. වාත්ස්‍යායන (Vatsyayana) නම් කතුවරයා , Tritiya Prakriti නම් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ තුන්වන කණ්ඩායමක් ගැන කතා කරයි. Tritiya Prakriti ස්ත්‍රියකගේ ස්වරූපයක් ගන්නේ නම්, ඔවුන් ස්ත්‍රිරූපිනි ලෙස හැඳින්වේ (බටහිර භාෂාවෙන් එය සංක්‍රාන්ති ලිංගික කාන්තාවක් විය හැකිය). Tritiya Prakriti පිරිමියෙකුගේ ස්වරූපය ගන්නේ නම්, ඔවුන් පුරුෂ්රූපිනි ලෙස හැඳින්වේ. *කාමසූත්‍ර* ක්වියර් භාවය ගැන ද කතා කරයි. එහි සම්පූර්ණ පරිච්ඡේදයක්ම Auparishtaka (මුඛ ලිංගිකත්වය) ට කැප කර ඇති අතර, එය පිරිමින් අතර පවතින බවට සුළුවෙන් සඳහන් කරයි! මෙය බොහෝ දුරට සාමාන්‍ය ලිංගික පුරුද්දක් විය හැකි බව අවධාරණය කරයි.

බුදුන් වහන්සේගේ දේශනා ඇතුළත් *විනය පිටකය* බෞද්ධ ග්‍රන්ථයේ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ඔබ්බට වෙනත් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සහ ලිංගික අනන්‍යතා දෙකක් ඇති බවට බුදුන්වහන්සේ සැලකූ බව අනාවරණය වේ. පළමුවැන්න, Ubhatobyarijanaka යන්න පිරිමි සහ ගැහැණු ලක්ෂණ දෙකම ඇති පුද්ගලයන් ගැන සඳහන් කළේය (සමහර විට, බටහිර භාෂාවෙන්, අන්තර්ලිංගිකයෙකු විය හැකිය). දෙවැන්න, Pandaka, පිරිමින් වූ නමුත් ඔවුන්ගේ ලිංගික ස්වභාවයේ ඌනතාවන් ඇති පුද්ගලයන් ලෙස සඳහන් කර ඇති අතර, තවදුරටත් ඔවුන් වර්ගීකරණය කළ හැකිය. නිදසුනක් ලෙස, Ussuyapandaka යන වෙනත් පුරුෂයෙකුගේ ශුක්‍රාණු තරලය ශරීර ගත කිරීම හරහා ලිංගික තෘප්තිය ලබාගත් පුද්ගලයෙකි. Opakkamikapandaka නම් තම වෘෂණ කෝෂ ඉවත් කළ අයෙකි. Pakkhapandaka යනු චන්ද්‍රයාගේ අදියර සමඟ සමකාලීනව උද්දීපනය වූ පුද්ගලයෙකි! Napumsakapandaka යනු පැහැදිලිව නියමවූ ලිංගික අවයව නොමැති පුද්ගලයෙකි (බටහිර භාෂාවෙන්, අන්තර්ලිංගික).

... අපේ ආගම් වල පවසා ඇත

අපගේ උපමහාද්වීපයේ බොහෝ ආගම්, ගතානුගතික අර්ථ කථනයන් නොතකා, ක්වියර්- සහ සංක්‍රාන්ති- භාවය පිළිගෙන ඇති අතර තවමත් පිළිගන්නා බව පෙන්නුම් කරයි.

ජෛයින් (Jain) ආගම කෙනෙකුගේ ජීව විද්‍යාව සහ ඔවුන්ගේ අනන්‍යතාව අතර වෙනස්කොට දක්වයි. මේ ආකාරයෙන් එය ලිංගිකත්වයෙහි වෙනස ජීව විද්‍යාත්මකව නිර්වචනය කර ඇති (ද්‍රව්‍යලිංග) ලෙසද, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමාජීයව නිර්වචනය කර ඇති (භාවලිංග) ලෙසද දකී. බටහිර වෛද්‍ය න්‍යායයේ ප්‍රතිඵලයක් ලෙස ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අතර වෙනස බොහෝවිට සැලකිල්ලට ගනු ලැබුවත්, ලෝකයේ පැරණිම ආගමක් වන ජෛයින් ආගම මෙම වෙනස කලකට පෙර දැක ඇත.

බෞද්ධ සහ හින්දු ආගම් ඓතිහාසිකව ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුන් ආකාරයකින් වර්ග කර ඇති අතර, ඒ කිසිවක් නිශ්චිත ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවක් සඳහන් නොකරයි. පළමුවැන්න, පුරුස (Purusa), සංලක්ෂිත වූයේ ලිංගික ලක්ෂණ තිබීම හෝ නොතිබීම මතය (උදාහරණක් ලෙස, ශිෂ්ණයක් හෝ යෝනි මාර්ගය). දෙවැන්න, ස්ත්‍රී (Stri) යන්නෙන් පෙන් වූයේ කෙනෙකුට ප්‍රජනනය කිරීමේ (බිහි කිරීමේ) හැකියාව ඇති බවයි. තෙවැන්න, නපුංසක පෙන්නුම් කළේ යමෙකුගේ පුරුෂශක්තිය හීනවී ඇති බවයි. මෙම විවිධ ආකාර වලින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පැවරීමෙන් පෙන්නුම් කරන්නේ, විශේෂයෙන්ම, අප දැනට බටහිර සමාජයන් තුළ දකින පරිදි, සමාජයට එසේ කළ හැකි එකම ක්‍රමය ද්විමය ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය නොවන බවය.

ප්‍රසිද්ධ භූතාන බෞද්ධ ගුරුවරයෙකු වන Dzongsar Khyentse Rinpoche ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ලිංගික විවිධත්වය ගැන බෞද්ධ පිළිගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් දේ ප්‍රකාශ කළේය. “ඔබේ ලිංගික දිශානතිය සත්‍යය අවබෝධ කර ගැනීම හෝ අවබෝධ කර නොගැනීම සමඟ කිසිදු සම්බන්ධයක් නැත. ඔබ පුරුෂ සමරිසි, විය හැකිය, ඔබ ස්ත්‍රී සමරිසි විය හැකිය, ඔබ සරල විය හැකිය. - පළමුව සත්‍යය අවබෝධ කර ගන්නේ කවුරුන්දැයි අපි නොදනිමු. රීස්සීම හොඳ දෙයක් නොවේ. ඔබ මෙය රුස්සන්නේ නම්, එයින් අදහස් වන්නේ ඔබ වැරදි දෙයක් රුස්සනු ලබන බවයි. නමුත් ඔබ ඉන් ඔබ්බට යා යුතුයි - ඔබ ගරු කළ යුතුයි.”

... අපගේ භාෂාවල පවසා ඇත

දකුණු ආසියාවේ බොහෝ ප්‍රදේශ තුළ ක්වියර් හෝ සංක්‍රාන්ති වීමේ ස්වභාවය විස්තර කරන භාෂාව ඇත. අපි භාෂාවන් ගැන 3 වන පරිච්ඡේදයේ තවදුරටත් කතා කරමු. නමුත්, දුෂ්කර ප්‍රශ්නයක් ලෙස, සමහර උර්දු ශබ්දකෝෂ වල **Dogana** සහ **Zanakhi** යන යෙදුම් වලින් දක්වන්නේ කාන්තාවක් විසින් තමා විසින්ම තෝරාගත් ප්‍රධාන කාන්තා මිතුරියකි (බටහිර යෙදුම් වල සමරිසි කාන්තාවකගේ පෙම්වතිය/සහකාරියක බවයි.) දකුණු ආසියාවේ සමහර කොටස්වල ඔවුන්ගේම විශේෂිත පාරිභාෂිතයක් නොමැත, නමුත් ඒ වෙනුවට, දකුණු ආසියාවේ අනෙකුත් පෙදෙස් වලින් පාරිභාෂිතය ඉල්ලා ගනිති. කෙසේ නමුත් උපමහාද්වීපයට හවුල් ඉතිහාසයක් ඇති බැවින් එය අර්ථවත් කරයි. තවද, බෙංගාලි සහ දෙමළ වැනි භාෂාවල් ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව නොමැති බව සැලකිල්ලට ගැනීම වැදගත් ය.

එය මනෝ රාජ්‍යයක් නොවීය, එහෙත්...

අපි මේ දක්වා අවධාරණය කළ පරිදි, ක්වියර් සහ සංක්‍රාන්ති අනන්‍යතාවල සාමාන්‍ය පිළිගැනීමක් නිසැකවම තිබුණි. දකුණු ආසියාවේ සැහෙන කොටසක් මෝගල් අධිරාජ්‍යය විසින් පාලනය කළ කාලයේ වැනි විවිධත්වය මර්දනයට සහ අප්‍රසාදයට ලක් වූ කාල වකවානු වලදී පවා ක්වියර් සහ සංක්‍රාන්ති පුද්ගලයන් නීතිමය නඩු පැවරීම් වලට මුහුණ දුන්නේ නැත. මේ කාලය තුළ සමහර අධිරාජ්‍යවරුන් සහ නායකයින් සමලිංගික බවට කට කතා පැතිර ගිය අතර කිසිදු තහනමකට මුහුණ දුන්නේ නැත.

යටත්විජිතකරණයට පෙර දකුණු ආසියාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙන් තොර සමාජයක් පැවතීම ගැන ඇතැමුන් කතා කරනු අපි දුටුවෙමු. මෙය එසේ වූ බවට අපට සහතික විය නොහැකි අතර, දකුණු ආසියානු සමාජයන් මූලික වශයෙන් සංවිධානය වී ඇත්තේ ද්විමය පිරිමි සහ ගැහැණු ලිංගිකත්වයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයන් වටා බව අපි දනිමු. එහෙත්, ද්විමය ලිංගිකත්වයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවයන් වැඩියෙන් උසස් හෝ “සාමාන්‍ය” ආකාරය ලෙස නොසැලකේ.

ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විවිධත්වය සමාජය ව්‍යුහගත කර පැවති ආකාරයට ඉඩ සලසා තිබුණු අතර, සෑමකෙනෙකුටම ඔවුන් සිටින ආකාරයටම පැවතීමට හැකි බහුත්වයක් තිබුණි.

විශාල “C” වචනය: යටත්විජිතකරණය

(Colonisation)

යුරෝපීයන් විසින් දකුණු ආසියාව යටත්විජිත බවට පත් කළ විට, ඔවුන් සමඟ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ගැන සීමිත අදහස් ඔවුහු ගෙන ආවෝය. ඔවුන් සිතුවේ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙන් අදහස් කළ හැක්කේ පිරිමි සහ ගැහැණු යන්න පමණක් බවත්, විෂම ලිංගිකතාව යමෙකුට තිබිය යුතු එකම යෝග්‍ය ක්‍රමය බවත් ය. සියවස් ගණනාවක් පුරාවට, අපගේ ප්‍රජාවන්ගෙන් සහ පවුල් වලින් අපට ලැබුණු පිළිගැනීම 21 වන සියවසේ අපි බොහෝවිට මුහුණ දුන් වෙනස්කොට සැලකීම සහ ප්‍රචණ්ඩත්වය බවට විපරිවර්තනය විය.

යටත්විජිතකරණයේ ක්වියර් සහ සංක්‍රාන්ති විරෝධී හැඟීම් නිතර නීතිය හරහා ප්‍රකාශ විය. නිදසුනක් වශයෙන්, බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ "පුද්ගලයාට එරෙහි වැරදි පනත 1861" හඳුන්වා දුන් අතර, සමරිසි පුරුෂ සමීපත්වය සිරගත කිරීමෙන් දඬුවම් දිය හැකි සාපරාධී වරදක් බවට පත් කළේය. ශ්‍රී ලංකාවේ ද එවැනිම නීතියක් බ්‍රිතාන්‍යයන් විසින් පනවන ලදී. 1995 දී පශ්චාත්- නිදහස් ශ්‍රී ලංකාවේ නීති සම්පාදකයින් මෙම නීතිය වෙනස්කොට සැලකීමක් ලෙස තීරණය කළ නමුත්, එය ඔබ සිතන හේතූන් නිසා නොවේ. කාන්තා සමරිසි සමීපත්වය සාපරාධයක් බවට පත් කළ විධිවිධානයක් ද ඔවුහු එකතු කළහ.

මෙම සමරිසි පුරුෂ-විරෝධී නීති සමහරක් අවංලගු කර ඇත. උදාහරණයක් ලෙස, නේපාලය 2007 දී ද, භූතානය 2021 දී ද, ඉන්දියාව 2018 දී ද, ඒවා අහෝසි කළහ. කෙසේවෙතත්, බංග්ලාදේශය, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව තුළ මෙම මර්දනකාරී නීති නොවෙනස්ව පවතී. ඇෆ්ගනිස්ථානයේ සහ මාලදිවයිනේ, චාරිත්‍ර මත පදනම් වූ නීතිය අනුව සමරිසි සමීප සබඳතා නීති විරෝධී වේ.

වෙනත් නීති ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ යටත්විජිත අදහස් ප්‍රකාශ කළේය. නිදසුනක් වශයෙන්, හිජ්රා පුද්ගලයන් මර්දනය කිරීමට හැකි පනතක් වූ ඉන්දියාවේ 1871 සාපරාධී ගෝත්‍රික පනත බ්‍රිතාන්‍යවරු සම්මත කළහ. මෙම නීතියට අනුව හිජ්රා ලියාපදිංචි කිරීම, ඔවුන්ව අවේක්ෂණය කිරීමට ඉඩදීම සහ ඔවුන් උපන් දින සිට "සාපරාධී ගෝත්‍රයක" කොටසක් ලෙස සලකුණු කිරීම අවශ්‍ය කෙරුණි.

ශ්‍රී ලංකාව තුළ, බ්‍රිතාන්‍යයන් 1841 දී අයාල ආඥා පනත සම්මත කළ අතර, එය සංක්‍රාන්ති ලිංගික පුද්ගලයන්, විශේෂයෙන් සංක්‍රාන්ති ලිංගික කාන්තාවන් අත් අඩංගුවට ගෙන රඳවා තබා ගැනීමට යටත්විජිත බලධාරීහු භාවිතා කළහ. ඉන්දියාවේ 1852 දී සම්මත කළ තවත් නීතියකින් අදහස් කළේ හිජ්රාට අවම වශයෙන් මුම්බායි ප්‍රදේශයේ ඔවුන්ගේ ඉඩම් හෝ නවාතැන් රාජසන්තක කිරීමට හැකි වූ බවයි. මතක තබාගන්න, පූර්ව යටත්විජිත දකුණු ආසියාවේ මෙම නීති වලට සමාන නීති තිබුණේ නැත.

මෙම යටත්විජිත අදහස් ප්‍රකාශ කළ තවත් ආකාරයක් වූයේ පොත් තහනම් කිරීම, නැවත ලිවීම, සහ ගිනි තැබීමයි. දකුණු ආසියා උපමහාද්වීපය පුරා, ඔවුන් විසින් “අපවිත්‍ර” යැයි සැලකූ පොත්, තහනම් කර ඉවත් කරන ලදී. විශේෂයෙන් කලින් සාකච්ඡා කළ පරිදි, සමකාමුක හෝ ක්වියර් සහ සංක්‍රාන්ති අන්තර්ගතයන්ගෙන් පිරුණු පොත් තහනම් කළහ. මෝගල් යුගයේ ලියැවුණු සමකාමුක තේමාවන් සහිත පොත් ඔවුහු යළි ලිවූ හ.

ඉතින්, යටත්විජිතකරණය කිහිපයක් දේ කළේය. එය අපගේ ප්‍රජාවන් අපට අසාමාන්‍ය සහ විදේශීය ලෙස දැකීමට සලස්වා, අපට අපවම අසාමාන්‍ය සහ විදේශීය ලෙස දැකීමට සැලැස්වීය. එය සාම්ප්‍රදායිකව පිළිගත් පරිසරයන් සමරිසි භීතිකාව, සංක්‍රාන්ති භීතිකාව සහ අන්තර් භීතිකාව සහිත ඒවා බවට පත් කළේය.

සාධාරණව කිවහොත්, අපගේ අනන්‍යතා සමහරක් දෙස තවමත් එදා පැවති ආකාරයටම බලන බැවින්, යටත්විජිතකරණය අපගේ ප්‍රජාවන් අපව දකින ආකාරය සම්පූර්ණයෙන්ම වෙනස් කර ඇති බව අපට පැවසිය නොහැක. නිදසුනක් වශයෙන්, හිජ්රා දිගින් දිගටම වෙනස්කොට සැලකීමට මුහුණ දෙන අතර, මිනිසුන්ට ආශිර්වාද කිරීමේ හැකියාව වෙනුවෙන් ඔවුන් ඓතිහාසිකව ගෞරවයට පාත්‍ර වූ අතර, මෙම ගෞරවය අදටත් පවතී.

අපගේ අනන්‍යතාවන්

මෙම සම්පතේ මෙම කොටසෙහි අපි ක්වියර් සහ සංක්‍රාන්ති දකුණු ආසියානු සන්දර්භය තුළ පවතින විවිධ අනන්‍යතා දෙස බැලුවෙමු. අපි ආරම්භ කිරීමට පෙර, සටහන් කිහිපයක් කිරීමට කැමැත්තෙමු.

අප පහත සාකච්ඡා කරන අනන්‍යතාවන් සමහරක් නෙවන පාර්ශවයන් ක්වියර් සහ සංක්‍රාන්ති දකුණු ආසියාතිකයින්ට ආරෝපණය කරන ලද වචන භාවිතා කරයි. අනන්‍යතාවන් සමහරක් අපගේ මුතුන් මිත්තන් විසින් ඔවුන්වම අර්ථ දැක්වීමට භාවිතා කළ වචන භාවිතා කරති. අනන්‍යතාවන් සමහරක් නින්දා සහගත අර්ථයක් සහිත වචන භාවිතා කළ නමුත් දැන් ශිෂ්ට බවට පුමුණුවා ඇති වචන භාවිතා කරයි. වෙනස් පුද්ගලයන්ට වෙනස් යෙදුම් වල වෙනස් අර්ථ තිබිය හැක.

තවද, මෙය ක්වියර් සහ සංක්‍රාන්ති දකුණු ආසියානු අනන්‍යතාවන්ගේ විස්තරාත්මක ලැයිස්තුවක් ලෙස භාවිතා නොකළ යුතු ය. මන්දයත්, සමහරක් අපට මඟහැරී ඇති බවට අපට විශ්වාස බැවිනි.

තවද, වෙනත් ආකාරයට බැලුවහොත්, මෙම සමහර යෙදුම් බටහිර කාචයක් මත තැබීම අපට ඉතා දුෂ්කර බව කිව යුතු ය. නිදසුනක් ලෙස, සමරිසි පුරුෂ හෝ සංක්‍රාන්ති යන ලේබලය, දකුණු ආසියානු යෙදුමක් සමඟ ඉතා හොඳින් නොගැලපෙනවා විය හැකිය. මෙය කම් නැත. අපේ භාෂාවන්ට සහ පාරිභාෂිතයන්ට වෙනස් අර්ථ ඇති අතර, අපි එය පිළිගත යුතු වෙමු. අනන්‍යතාවන් පිළිබඳ මෙම කොටස අපි සපයන්නේ, අපේ මුතුන්මිත්තන් ඔවුන්ගේ ලිංගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගිකතාව විස්තර කිරීමට භාවිතා කළ භාෂාව ගැන අවබෝධයක් ලබාගැනීමට හැකි වන බැවිනි. අපි මෙය සිදුකරන්නේ අප සියලුදෙනාම මෙම භාෂාවට ආපසු යා යුතු බව (ඔබට අවශ්‍ය නම් කිසිවක් ඔබව වළක්වන්නේ නැතත්) සහ බටහිර යෙදුම් ඉවත් කිරීමට යෝජනා කිරීමට නොවේ. ක්වියර් සහ සංක්‍රාන්ති ප්‍රජාව තුළ යටත් විජිතකරණය ඉවත් කිරීම පිළිබඳ විශාල විවාදයක් ඇති බව අපට පැහැදිලි වන අතර, බොහෝ අය තර්ක කරන්නේ මෙයින් අදහස් කරන්නේ අපේම ස්වදේශීය ලේබල් වෙනුවෙන් බටහිර ලේබල් අත්හැරිය යුතු බවයි. මෙහිදී වැදගත් යැයි අප සිතන දෙය නම් අපගේ ප්‍රජාවට ඔවුන් කැමති ආකාරය ස්වයං-නිර්වචනය කළ හැකිය.

ඔවුන්ට තමන්ගේම දේශීය භාෂාවක් භාවිතා කිරීමට අවශ්‍ය නම්, එය විශිෂ්ට ය. කෙසේවෙතත්, ඔවුන්ට ක්වියර් සහ සංක්‍රාන්ති වැනි බටහිර යෙදුම් භාවිතා කිරීමට අවශ්‍ය නම්, මෙම යෙදුම් වල ඔවුන්ට අර්ථයක් ඇති බැවින්, එය ද ඒ හා සමානවම විශිෂ්ට ය. අප සිතන්නේ අපේ ස්වදේශීය යෙදුම් මෙන්ම ක්වියර් සහ සංක්‍රාන්ති වැනි බටහිර ලේබල් ද අලංකාර බවයි. අපගේ ප්‍රජාව ඔවුන්ගේ අත්දැකීම් විස්තර කරන වෙනත් ස්වදේශීය භාෂාවක් නොමැති විට ඔවුන්ගේ ස්වයං හැඟීම විස්තර කිරීමට මෙම යෙදුම් භාවිතා කර ඇති අතර අපි එයට ගරු කරමු.

ක්වියර් සහ සංක්‍රාන්ති දකුණු ආසියානු අනන්‍යතාවන් විස්තර කිරීමට භාවිතා කර ඇති වචන පිළිබඳව අප සොයාගත්, එක් සිත්ගන්නා සුළු කරුණක් නම්, බොහෝවිට, මෙම වචන වලට ලිංගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගික ලක්ෂණ සහ ලිංගික ඉරියව්ව (උදාහරණයක් ලෙස, ඉහළ හෝ පහළ) යන සියල්ලම එකම වේලාවකදී ඇතුළත් කරන බවයි! එක් යෙදුමකට බහුවිධ අර්ථයන් ලබාදිය හැකි ආකාරයෙන් අපගේ භාෂාව ඉතාමත් අද්විතීය යි.

අපි පහත සඳහන් අනන්‍යතා හරහා යමින් ඒවා සාකච්ඡා කරන විට, අපි රටින් රටට කාචයක් භාවිතයෙන් එසේ කරන්නේ එය ව්‍යුහගත කිරීමට පහසු ක්‍රමයක් බැවිනි. හිජ්රා දේශසීමා හරහා යන අනන්‍යතාවක් බැවින්, අපි හිජ්රා හැර සියලුම අනන්‍යතාවන් සඳහා එසේ කරමු. අපි ඓතිහාසික සහ නූතන යෙදුම් අතර වෙනසක් ඇති කරන විට, එසේ කරන්නේ නූතන ඒවායේ අර්ථය අඩු කිරීමට නොවේ. බොහෝ විට නූතන යෙදුම් සහස්‍ර ගණනාවක් පුරා පැවති ආකාරයන් පිළිබිඹු කරයි.

හිජ්රා

හිජ්රා යනු අන්තර්ලිංගික, සංක්‍රාන්තිලිංගික සහ/හෝ නපුංසක පුද්ගලයන් විස්තර කිරීමට භාවිතා කරන ආවරණ යෙදුමකි. මේ ආකාරයෙන්, එය ලිංගික

ලක්ෂණ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමඟ සංයෝජනය කරයි. මෙම යෙදුම ඉන්දියාව, නේපාලය, සහ බංගලාදේශය හරහා භාවිතා කරයි.

හිජ්රා යනු ස්ත්‍රීන් ලෙස පෙනී සිටින තුන්වන ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ පුද්ගලයන් වන අතර, එයින් අදහස් වන්නේ ඔවුන් පිරිමි හෝ ගැහැණු ලෙස හඳුනා නොගන්නා බවයි. අපි "තුන්වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය" යන යෙදුම භාවිතා කරන්නේ, එය අපගේ පර්යේෂණය අපට පවසා ඇති දේ පිළිබිඹු කරන බැවිනි. නමුත් එය ඉහළින්ම වාදයට ලක්වන යෙදුමක් බව අපි ද හඳුනා ගනිමු. හිජ්රා උපතේදී පිරිමියෙකුගේ ස්වරූපය පවරන අතර, ස්ත්‍රී ආකාරයෙන් පෙනී සිටියි.

ඉහත පැහැදිලි කළ පරිදි, සංස්කෘත මිථ්‍යා කථා වල හිජ්රා හට ඔවුන්ගේ පක්ෂපාතිත්වය හා ස්ථිරභාවය වෙනුවෙන් රාම් දෙවියන්ගෙන් ආශිර්වාද ලබා ඇත. මෙම ආශිර්වාද වලට අලුත විවාහ වූවන්ට සශ්‍රීකත්වය ප්‍රදානය කිරීම සහ 'බධායි' (Badhai) නමින් හඳුන්වන ක්‍රියාවලියක දී අලුත උපන් දරුවන් ආශිර්වාද කිරීම ඇතුළත් වේ.

නිර්වානයට භාජනය වන (ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු කිරීමේ ශල්‍ය ක්‍රියාපටිපාටි) හිජ්රා akkva ලෙස හඳුන්වන අතර, එසේ නොකරන අය සිබ්‍රි (cibri) ලෙස හැඳින්වේ. සමහර හිජ්රා ඉරිදා-සඳුදා පෙති (Sunday-Monday golis) ලෙස හඳුන්වන හෝමෝන නිෂ්පාදන භාවිතා කරති.

ඇෆ්ගනිස්ථානය

ෂාක් (Shakh) සහ මුරාත් (murat) යනු ක්වියර් සහ සංක්‍රාන්ති ඇෆ්ගන්වරුන් තමුන් හඳුන්වා දෙන පද වේ. කෙසේවෙතත්, මෙම යෙදුම් බොහොමයක් මෙන්ම ෂාක් සහ මුරාත් යන යෙදුම් ක්වියර් සහ සංක්‍රාන්ති ලෙස සෘජුවම පරිවර්තනය නොවේ.

ෂාක් යනු "අං" යන අරුත ෆාර්සි/දාරි (Farsi/Dari) වචනයක් වන අතර, පුරුෂරූපී පිරිමින් ගැන සඳහන් කරන අතර, ඔවුහු විශේෂිත ස්ත්‍රී පුරුෂ සමාජභාවයකට වඩා, වැඩියෙන් ස්ත්‍රීරූපී පුද්ගලයන් වෙත ආකර්ෂණය වෙති.

මුරාත් යනු ෆාර්සි වචන වන **mard** (පුරුෂයා) සහ **aurat** (ගැහැණිය) යන වචන ඒකාබද්ධ කරන වචනයකි. එය වචන මත කරන සෙල්ලමක් වන අතර පුරුෂරූපී සහ ස්ත්‍රීරූපී අනන්‍යතා සහ ප්‍රකාශන වල මිශ්‍රණයක් ඇති පුද්ගලයෙකු විස්තර කරයි.

බංග්ලාදේශය

අප මිත්‍ර ෂොමුද්‍රෝ ඉහත පැහැදිලි කළ පරිදි, ක්වියර් සහ සංක්‍රාන්ති ලිංගික වීම විස්තර කරන බෙංගාලි භාෂාවක් ඇති බවක් නොපෙනේ. මෙය නිසැකවම අපි බංග්ලාදේශයේ නොසිටි නිසා නොව, බංග්ලාදේශය යටත්විජිත ඉන්දියාවේ කොටසක් වීමේ ඓතිහාසික සන්දර්භය නිසා ය. එබැවින්, නූතන ඉන්දියාවේ භාවිතා වන බොහෝ පාරිභාෂිතයන්, උදාහරණයක් ලෙස හිජ්රා ඇතුලුව, බංග්ලාදේශයේ භාවිතා වේ.

භූතානය

2015 වසරේදී **Dzongkha** (භූතාන) භාෂාව වර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම අරමුණු කරගත් සංවිධානයක් වන **Dzongkha** සංවර්ධන කොමිෂන් සභාව පහත සඳහන් යෙදුම් භාෂාවට හඳුන්වා දුන්නේය:

- ද්විලිංගික - ཟུང་སྒྱུ ར།
- සමරිසි පුරුෂ- མཚུངས་སྒྱུ ར།
- අන්තර්ලිංගික - མ་ནི ང།
- සමරිසි කාන්තා - མོ ་སྒྱུ ར།
- සංක්‍රාන්ති සමාජභාවී - མཚན་སྒྱུར།
- අනෙකුත් ලිංගික පක්ෂ වල ඇඳුම් අඳින- སྒྱུ ད་སྒྱུར།
- සමලිංගිකතාව- འདྲ་སྒྱུ ར།

- සමලිංගික භීතිකාව - མཚུངས་སྦྱོ ར་ཞེན་ལོ ག

ඉන්දියාව

ඉන්දියාවේ හිජ්රා යන යෙදුමට ඔවුන්ගේම අනන්‍යතාවන් අඩංගු වන බොහෝ භූගෝලීය ප්‍රභේද ඇත. නිදසුනක් වශයෙන්, දකුණු සහ බටහිර ඉන්දියාවේ **Jogapps/Jogtas** යනු උපතේදී පුරුෂයෙකු ලෙස පවරන ලද ස්ත්‍රී ස්වරූපයක් ඇති පුද්ගලයන් වන අතර, යෙල්ලම්මා දෙවිදුවගේ පොළොව මත ප්‍රකාශනයන් ලෙස සැලකේ. තමිල්නාඩුවේ තිරුනංගෙයි එනම් “ගෞරවනීය කාන්තාව”යන්නෙන් සංක්‍රාන්ති ලිංගික කාන්තාවන් විස්තර කරයි. තෙලිඟු භාෂාවෙන් හිජ්රා හඳුන්වන්නේ **kojjas** ලෙසය. ශිව ශක්ති සහ අරවානි යනු සංක්‍රාන්ති බව නියෝජනය කිරීමට භාවිතා කරන වචන වේ.

“පිරිමි පූජකවරිය” ලෙස පරිවර්තනය වන **Nupa Maibi** යන යෙදුම ඉන්දියාවේ ඊසානදිග කලාපයේ සංක්‍රාන්ති ලිංගික පිරිමි පූජකයින් විස්තර කරයි.

Kothi යන යෙදුමෙන් අදහස් කරන්නේ පිරිමින් වෙත ආකර්ෂණය වන සහ ලිංගිකත්වයේදී ප්‍රතිග්‍රාහක භූමිකාව භාර ගන්නා ස්ත්‍රීරූපී පිරිමියෙකි. ධුරානි (**Dhurani**) යනු කොචින්හි ජීවත් වන **kothi** හැඳින්වීමට භාවිතා කරන යෙදුමකි. බටහිර යෙදුමක් භාවිතා කරමින්, ඔබට ඔවුන්ව ට්වින්ක් (**twink**) ලෙස විස්තර කළ හැකිය. . ("Twink" යනු සාමාන්‍යයෙන් යොවුන් වියේ අග සිට විසි ගණන්වල පසුවන පිරිමියෙකු සඳහා වන සමලිංගික ස්ලැන්ග් වන අතර, ඔහුගේ ගතිලක්ෂණ අතර සිහින් සිට සාමාන්‍ය දේහය දක්වා, තරුණ පෙනුම, කුඩා හෝ සිරුරේ රෝම නොමැති වීම සහ විචිත්‍රවත් බව ඇතුළත් විය හැකිය. Twink වලසා සමඟ සැසඳිය හැකි උදාසීන විස්තරයක් ලෙසත්, අපකීර්තිමත් ලෙසත් භාවිතා වේ).

Panthi යන්නෙන් අදහස් කරන්නේ පිරිමින්ට ආකර්ෂණය වන ලිංගිකව හැසිරීමේදී ඉහළින් සිටින පිරිමියෙකුට ය. ඔවුන් “පුරුෂාකාර” ලෙස සලකන ලබන අතර, පුරුෂරූපී ආකාරයෙන් පෙනී සිටිති.

අපට හමු වූ තවත් පැරණි යෙදුම් තිබේ. නමුත් ඒවා නූතන ඉන්දියාවේ භාවිතා වන්නේ ඉතා අඩුවෙනි. ස්වෛරිනී යන පදයේ තේරුම ස්වාධීන කාන්තාවක් වන අතර එය බොහෝවිට සඳහන් කරන්නේ සමරිසි කාන්තාවන් ගැනය. එමෙන්ම, Kilba යන යෙදුම සඳහන් කරන්නේ සිස්ජෙන්ඩර් (cisgender උපතින් පැවරුණු ස්ත්‍රී පුරුෂ සමාජභාවය) සමරිසි පිරිමින් ගැනය. Kami යන යෙදුම ද්විලිංගික පුද්ගලයන් විස්තර කරයි.

මාලදිවයින

Dhivehi ලෙසද දක්වන, මාලදිවයිනේ භාෂාව පිළිබඳ අපගේ පර්යේෂණයෙන්, ක්වියර් සහ සංක්‍රාන්ති බව විස්තර කරන යෙදුම් පහත දැක්වේ:[1]

- සමරිසි පුරුෂ (Gay) - ޖިވާޑް
- සමරිසි කාන්තා (Lesbian) - ލެސްބިއަން
- සංක්‍රාන්ති ලිංගික (Transgender) - ޓްރާންސްޖެންޑަރު
- ද්විලිංගික (Bisexual) - ބައިސެކްޝުއަލް“
- ක්වියර් (Queer) - ކްވިއަރު

[1] අපගේ උපරිම උත්සාහය තිබියදීත්, අපට මෙම යෙදුම් ස්වාධීනව සත්‍යාපනය කිරීමට නොහැකි වී ඇත. ඒවා ලබාගෙන ඇත්තේ විවෘත මූලාශ්‍ර සම්පත් වලින් වන අතර, එම නිසා මාලදිවයිනේ මිනිසුන් භාවිතා කරන හොඳම භාෂාව පිළිබිඹු නොකරනු ඇත.

නේපාලය

නේපාලය ක්වියර් සහ/හෝ සංක්‍රාන්ති යන්න විස්තර කිරීමට භාවිතා කරන විවිධ යෙදුම් රාශියකට නිවහන වේ.

Meti යන පදය ඉන්දියාවේ ඩාර්ජිලිංහි ආරම්භ වූවක් යැයි සැලකෙන අතර, එය ව්‍යුත්පන්න වී ඇත්තේ “කෙනෙකුගේ පිපාසය සංසිඳුවා ගැනීම” යන අර්ථය ඇති වාක්‍ය ඛණ්ඩයකිනි. Meti යනු පිරිමින්ට ආකර්ෂණය වන ස්ත්‍රීරූපී පිරිමියෙකු වන අතර, ලිංගිකව හැසිරීමේදී පහළින් සිටී. Meti යන්නෙකු වීමේ ප්‍රධාන කොටස වන්නේ පහළ සිටින්නෙක් වීම වන අතර, ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රකාශ කිරීම සෑමවිටම ස්ත්‍රීරූපී ලෙස ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. Fulumulu යන පදය සමාන ආකාරයක් විස්තර කරන පදයක් වන අතර, එය වැඩියෙන්ම නේපාලයේ නැගෙනහිර ප්‍රදේශයේ භාවිතා වේ. හිජ්රා ද නේපාලයේ භාවිතා වේ.

Tas යනු උපතේදී පුරුෂයෙකු ලෙස පවරන ලද, පිරිමියෙකු ලෙස පෙනී සිටින, පිරිමින්ට ආකර්ෂණය වන, ලිංගිකව හැසිරීමේදී ඉහළින් සිටින කෙනෙකු විස්තර කිරීමට භාවිතා කරන යෙදුමකි. Tas පුද්ගලයෙකු වීමේ වැදගත් කොටස වනුයේ, ලිංගිකව හැසිරීමේදී ඔවුන් භාරගන්නා ඇතුල් කිරීමේ භූමිකාවයි.

ක්වියර් සහ සංක්‍රාන්ති වීම යන බටහිර සංකල්ප පිළිබිඹු කරන නේපාලි සහ එහි උපභාෂා වල වඩාත් නවීන යෙදුම් වර්ධනය කර ඇත. උදාහරණ වශයෙන්:

- සමරිසි පුරුෂ - Purus Samalingi,
- සමරිසි කාන්තා - Mahila Samalingi.
- ද්විලිංගික – Duilingi,
- අන්තර්ලිංගික - Antarlingi,
- සංක්‍රාන්ති ලිංගික හෝ තෙවැනි ස්ත්‍රී පුරුෂ සමාජභාවය - Tesro Lingi.

පාකිස්ථානය

පාකිස්ථානය තුළ ක්වියර් සහ සංක්‍රාන්ති වීම විස්තර කරන උර්දු යෙදුම් ඇත. Khawaja Sara යනු හිජ්රා, සංක්‍රාන්ති ලිංගික කාන්තාවන් සහ නපුංසකයින් සඳහා භාවිතා කරන ආවරණ යෙදුමකි. එය හිජ්රා යන්නට සමාන උර්දු වචනයකි. ඔවුහු, badhai ඇතුළු අප ඉහත පැහැදිලි කළ බොහෝ සාම්ප්‍රදායයන් හි නිරත වෙති. පාකිස්ථානයේ (සහ ඉන්දියාවේ) පන්ජාබ් ප්‍රදේශයේ Khusra යන පදය Khawaja Sara විස්තර කිරීමට භාවිතා කරන නමුත්, එය බොහෝවිට අපහාසාත්මක අයුරින් භාවිතා වේ. බොහෝ Khusra විශ්වාස කරන්නේ ඔවුන්ගේ භෞතික ශරීරය ගැහැණු ආත්මය මඟින් කොටු කරගෙන ඇති බවත්, එබැවින් වැඩියෙන් ස්ත්‍රීරූපී ලෙස හැසිරෙන බවත්, ක්‍රියා කරන බවත් ය.

Khunsa Mushkil යන යෙදුම පිරිමි හෝ ගැහැණු ලෙස අර්ථ දැක්වීමට අපහසු කෙනෙකු විස්තර කරයි. බටහිර භාෂාවෙන් එය පුංජායාංගී (androgynous) යන්නට සමාන විය හැකිය.

Murat/moorat යන පදය පාකිස්ථානයේ ද භාවිතා වේ. ඇෆ්ගනිස්ථානය කොටසේ අපි පැහැදිලි කළ පරිදි, මෙම පදය පුරුෂ සහ ස්ත්‍රී ශක්තීන් දෙකම නියෝජනය කරන අතර, තමන්ව එලෙස ප්‍රකාශ කර ගනිති.

Zenana යන පදය පරිමින් සමග ලිංගිකව හැසිරෙන ස්ත්‍රීරූපී පිරිමින් විස්තර කරයි.

ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ නාච්චි ප්‍රජාව පහසුවෙන් වර්ගීකරණය කළ නොහැකි සිත් ඇදගන්නා සුළු සහ බහුවිධ මුහුණත් කණ්ඩායමකි. ඔවුන්ගේ ඉතිහාසය සංස්කෘතික, ආගමික සහ සමාජීය සන්දර්භයන් සමඟ ගැඹුරින් එකට වෙළී පවතිමින්, ඔවුන්ගේ අනන්‍යතාව සංකීර්ණ සහ වැදගත් කරයි. “නාච්චි” යන යෙදුම ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයන් හැඳින්වීමට බහුලව භාවිතා වේ. සමහර නාච්චි ඔවුන් පෙර ජීවිතයේ කාන්තාවන් බවත්, ඔවුන්ගේ වර්තමාන අනන්‍යතාව මෙම අත්දැකීමේ ප්‍රතිඵලයක් බවත් පැහැදිලි කරති. බොහෝදෙනෙක්

තම ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු කිරීමේ ක්‍රියාවලියක් හරහා නොයාමට තීරණය කරති. ඒ වෙනුවට තමන්ගේ ස්ත්‍රීරූපී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ආත්මීයභාවය සැමරීමට සහ තමන්ගේ ජීව විද්‍යාත්මක "පුරුෂත්වයේ" ප්‍රධාන අංග වලට සමීප වීමට තෝරා ගනිති. නාච්චි යන පදය සමරිසි ප්‍රජාව විසින් පිරිමි ලෙස හඳුනාගන්නා, සහ පිරිමින් වෙත ආකර්ෂණය වන ස්ත්‍රීරූපී පිරිමින් විස්තර කිරීමට ද භාවිතා කරයි. නාච්චි දැඩි ලෙස පිරිමින් සමඟ සබඳතා ඇති කර ගැනීමට කැමති අතර, ඔවුන්ගේ පැවැත්මට සියවස් ගණනාවකට පෙර දිවෙන ඓතිහාසික මූලයන් ඇත.

නාච්චි ප්‍රජාවට සශ්‍රීකත්වය පිළිබඳ හින්දු දෙව්දුව සමඟ පුරාණ සම්බන්ධයක් ඇත. නපුංසකයන් බවට පත්වීමෙන්, ඔවුන් අර්ධ-පූජනීය තත්ත්වයක් ලබා ගන්නා අතර, අලුත විවාහ වූවන් සහ අලුත උපන් බිළිඳුන්ගේ සෞඛ්‍යය සහ සශ්‍රීකත්වයට ආශීර්වාද කළ හැකිය. දෙමළ භාෂාව කතා කරන උතුරු පළාතේ කාන්තාවන් සහ පිරිමින් ඇඳුම් මාරු කර ඇඳීම සංස්කෘතික ව්‍යූහයෙහි කොටසක් වන අතර, පිරිමින් තුළ ස්ත්‍රීභාවයේ සංකල්පයෙහි නුපුරුදු බව අඩු කරයි.

සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව සමරිසි යන සිංහල යෙදුම භාවිතා කළ යුතු බවට ඇතැම් සංක්‍රාන්ති ලිංගික පුද්ගලයන් යෝජනා කර ඇත. මෙම පදය සමලිංගික සබඳතාවයක් විස්තර කරන බැවින් එයට අකැමැත්තක් ප්‍රකාශ වී ඇත. අනෙක් සමහරුන් යෝජනා කර ඇත්තේ සිංහල භාෂාවෙන් සංක්‍රාන්ති ලිංගිකයන් ලෙස පරිවර්තනය වන සංක්‍රාන්ති යන වචනය ප්‍රජාව විසින් භාවිතා කරන ලෙස ය.

කෘතඥතාවයෙන් අවසන් කිරීම

දැන් ඔබට පැහැදිලි වේවි! ක්වියර් සහ සංක්‍රාන්ති වීම "සුදු පුද්ගලයාගේ දෙයක්" නොවන බව අප ඔබට පෙන්වා දී ඇතැයි අපි බලාපොරොත්තු වෙමු; එය බෙහෙවින් "දුඹුරු පුද්ගල දෙයක්" හෝ ඊටත් වඩා "මිනිස් දෙයකි".

දකුණු ආසියාව යටත්විජිතකරණය වීමට පෙර , අපේ අනන්‍යතාවයන්ට ආදරය, පිළිගැනීම, රැකගැනීම, ලැබුණු අතර, ඇතැම් විට, ගෞරවයට පාත්‍ර විය. නමුත් යටත්විජිතකරණය මෙය වෙනස් කළේය.

එය අපගේ ජනතාව අපට එරෙහි වීමටත්, වෛරය සහ කෝපය අප වෙත යොමු කිරීමටත් සැලැස්වීය.

කෙසේවෙතත්, මෙම ඉතිහාසය පෙන්නුම් කරන්නේ එය එසේ විය යුතු නැති බවයි.

අපේ ජනතාවට අපට නැවත ආදරය කිරීම, පිළිගැනීම සහ රැකගැනීම කළ හැකිය. ඔවුන් එය දැනටමත් ආරම්භ කර ඇත. නමුත් ඔවුන්ට එසේ කිරීමට හැකි වන්නේ අපි අපගේ එක් කොටසකට වඩා මුළු ආත්මයටම ආදරය කිරීමට පටන් ගත් විට පමණි. අපගේ මුතුන්මිත්තන් සහ ඔවුන්ගේ සමාජයන් ලිංගික විවිධත්වයෙන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විවිධත්වයෙන්, ජනවාර්ගික විවිධත්වයෙන් සහ ආගමික විවිධත්වයෙන් යනුවෙන් මේ සියල්ලම එක්වර තිබියදී සාමයෙන් සිටි බව මෙම සම්පත ඔබට පෙන්වා ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. ඇත්ත වශයෙන්ම ඔවුන්ට ඒ සඳහා ආදරය කරන ලදී. අපටත් එතැනට යා හැකිය.

අපි දැනට එය තිබෙන්නට ඉඩ හරිමු. නමුත්, අපි යාමට පෙර ඔබට තහවුරු කිරීම් කිහිපයක් ලබා දීමට අවශ්‍ය ය:

- මම කිසිවෙකුට මගේ, සංස්කෘතිය උදුරා ගැනීමට හෝ මගේ අනන්‍යතාවන් මගේ ජනවාර්ගිකත්වයට හෝ ආගමට නොගැලපෙන බව පැවසීමට ඉඩ නොදෙමි. මගේ ක්වියර් සහ සංක්‍රාන්ති මුතුන්මිත්තන් මා දෙස බලා සිනාසෙති. ඔවුහු මා ගැන ආඩම්බර වෙති.
- මගේ අනන්‍යතාවන් පරම්පරා ගණනාවක් පුරා ගොඩනඟා ඇත. ඒවා දේශීය ඉතිහාසය තුළ, මගේ ජනතාවගේ ඉතිහාසයන් තුළ පදනම් වී ඇත.

- මගේ මුතුන්මිත්තන්ගේ ක්‍රියාවන් සහ ආදරය මඟින් මම නිදහස් වී ඇත්තෙමි.
- මම මගේ සියලුම කොටස් සහ ඒවා සතුව ඇති වටිනාකම පිළිගනිමි.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කරදර නොවන්න; අපි මෙම සම්පතේ තොරතුරු සෑදුවේ නැත - අපි පර්යේෂණ කර එයට ඇතුල් කරන දේ ගැන දැඩි ලෙස සිතුවෙමු. මෙන්න අපි විශ්වාසය තැබූ මූලාශ්‍ර ලැයිස්තුවක්:

"Happiness and Harmonization – LGBT Laws in Bhutan" Salzburg Global Seminar <www.salzburgglobal.org>.

Ahmad Qais Munhazim "Afghan Muslim Aunties and Their Queer Gifts" (2023) 46(1) South Asia: Journal of South Asian Studies 206.

Akhilesh Pillalamarri "Afghanistan's Love-Hate Relationship With Homosexuality" (2016) The Diplomat <www.thediplomat.com>.

Alamgir "Khawaja Sara and Hijra: Gender and Sexual Identity Formation in Postcolonial Islamic Pakistan" (2023, Masters thesis, RMIT University).

Amit Gerstein ""So What Are You?": Nepali Third Gender Women's Identities and Experiences Through the Lens of Human Rights Development Discourse" (2020) 3 The GW Undergraduate Review 18.

Amit Kumar Singh "From Colonial Castaways to Current Tribulation: Tragedy of Indian Hijra" (2022) 40(2) Unisia 297.

An Ordinance to Provide a General Penal Code for Ceylon 1883.

Andrea Nichols "Dance Ponnaya, Dance! Police Abuses Against Transgender Sex Workers in Sri Lanka" (2010) 5(2) Feminist Crimonology 195.

Aruni Hemanthi Wijayath "Recognition of Transgender Community in Domestic Legal Regime: A Comparative Analysis between Sri Lanka and India" (2020) 1(1) KnowEx Journal of Social 41.

Bipasha Chakraborty "Vikriti Evam Prakriti: What seems unnatural, is natural" (2021) Honi Soit <honisoit.com>.

Buggery Act 1533.

Criminal Tribes Act 1871.

Dzongkha Development Commission (2015) <www.facebook.com>.

Gayathri Reddy *With Respect To Sex: Negotiating Hijra Identity In South India* (University of Chicago Press, 2005).

Hoshang Merchant *Yaraana: Gay Writing from South Asia* (Penguin Books India, 2010).

Jody Miller and Andrea Nichols "Identity, sexuality and commercial sex among Sri Lankan nachchi" (2012) 15(5/6) Sexualities 554.

John Leupold "To Be, or Not to Be, in Bhutan" (2016) The Gay and Lesbian Review <glreview.org>.

Kaushalya Ariyarathne "Priest, Woman and Mother: Broadening the Horizons through Transgender/nachchi Identities in Sri Lanka" (2022) 43(2) Sri Lanka Journal of the Humanities 19.

Kaushalya Ariyarathne "To be or Not to be Seen? Paradox of Recognition among Trans Men in Sri Lanka" (2021) 15 Masculinities Journal of Culture and Society 66.

Kenneth Ballhatchet *Race, Sex and Class under the Raj: Imperial Attitudes and Policies and Their Critics, 1793-1905* (Weidenfeld and Nicholson, 1980).

Lopamundra Sengupta *Human Rights of the Third Gender in India: Beyond the Binary* (Routledge India, 2023).

Maura Reynolds "Kandahar's Lightly Veiled Homosexual Habits" (2002) Los Angeles Times <www.latimes.com>.

Offences against the Person Act 1861.

Pashtun Sexuality (Human Terrain Team (HTT) AF-6, Research Update and Findings).

Rohit Dasgupta *Digital Queer Cultures in India: Politics, Intimacies and Belonging* (Routledge India, 2019).

Ruth Vanita and Saleem Kidwai "Rekhti Poetry: Love between Women (Urdu)" in Ruth Vanita and Saleem Kidwai (eds) *Same-Sex Love in India: Readings in Indian Literature* (Palgrave MacMillian, 2000) 220.

Ruth Vanita *Queering India: Same-Sex Love and Eroticism in Indian Culture and Society* (Routledge, 2002).

Saittawut Yutthaworakool "Understanding the Right to Change Legal Gender: A Case Study of Trans Women in Sri Lanka" (2020, Masters thesis, Global Campus Asia-Pacific).

Santhushya Fernando, Senel Wanniarachchi and Janaki Vidanapathirana *Montage of Sexuality in Sri Lanka* (UNFPA and College of Community Physicians of Sri Lanka, 2018).

Shakthi Nataraj "The Thirunangai Promise: Gender as a Contingent Outcome of Migration and Economic Exchange" (2022) 19 Anti-Trafficking Review 47.

Shraddha Chatterjee "Transgender Shifts: Notes on Resignification of Gender and Sexuality in India" (2018) 5(3) TSQ: Transgender Studies Quarterly 311.

Sushmita Gonsalves "A Constructed Sexuality: Re-Discovering the Jogappas of South and West India" (2022) 2(1) Skylines of Anthropology 45.

Swakshadip Sarkar "Dissecting Universality of Homosexual Identity Formation From West Bengal's Frame of Reference" (2020, unpublished paper).

UNDP and Williams Institute *Surveying Nepal's Sexual and Gender Minorities: An Inclusive Approach* (Bangkok, 2014, UNDP).

Walter Penrose "Colliding Cultures: Masculinity and Homoeroticism in Mughal and Early Colonial South Asia" in Katherine O'Donnell and Michael O'Rourke (eds) *Queer Masculinities, 1550-1800: Siting Same-Sex Desire in the Early Modern World* (Palgrave Macmillan, 2006) 1550.